# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 789/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 09/05/2024

පැය 1600

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01.** **2024.05.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 08 | 07 | 127 | 525 | තඹ දඟර 04<br>යකඩ බැරල් 06<br>බුලි 02<br>ගෑස් සිලින්ඩර් 01<br>ගෑස් ලිප් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු හා දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුර**

2024.05.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ඉලුප්පුකඩවායි කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් මුලංකාවිල් පොලිස් වසමේ නාච්චිකුඩා ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 150 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මුලංකාවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ නාච්චිකුඩා ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** මුලංකාවිල් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම් කඳවුර

2024.05.08 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සෙට්ටිකුලම් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පුවරසන්කුලම් පොලිස් වසමේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 170 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පුවරසන්කුලම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වූ වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පුවරසන්කුලම් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**